රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 02/2012

මගේ අංකය: PSC/EST/1/7/1/2011
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 177, නාවල පාර,
නාරාහේන්පිට.

2012 සැප්තැම්බර් මස 06 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 වන කාණ්ඩයේ 178 වැනි වගන්තිය සංශෝධනය කිරීම**

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 12/0745/523/025 අනුව 2012 ජුනි මස 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති 1 වන කාණ්ඩයේ 178 වැනි වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

178. (i) කිසියම් නිලධාරියෙකු වයස අවුරුදු 57 ඉක්මවා සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම් සේවා දිර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස දක්වා සේවයේ රැඳී සිටීමට නිලධරයාට ඉඩ දෙනු ලැබේ.

(ii) අවුරුදු 55 සිට 60 අතර කාලපරිච්ඡේදය තුළ නිලධරයාගේ අභිමතය පරිදි මාස 03 ක කල්දීමක් කර විශ්‍රාම යැමේ අයිතිය නිලධරයාට ලබාදෙනු ඇත.

(iii) අවුරුදු 57 න් පසුව නිලධරයාගේ කාර්යක්ෂමතාව හා සේවා තත්වය සතුටුදායක නොවන බව අදාළ පත්කිරීම් බලධරයා තීරණය කරන්නේ නම් එයට එරෙහිව නිලධරයාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සැලසෙන ආකාරයෙන් මාස 06 ක කල් දීමකින් පසුව විශ්‍රාම ගැන්වීමේ බලය පත්කිරීම් බලධරයා වෙත පවරනු ලැබේ.

එතෙකුදු වුවත්,

(iv) නිලධරයාට එරෙහිව විනයානුකූල කටයුතු සිදු කෙරෙමින් පවතින විටෙක හෝ විනයානුකූල කටයුතු කිරිමට අදහස් කර ඇති විටෙක නිලධරයා විශ්‍රාම ගැන්විය යුත්තේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තියට යටත් කොට වන්නේය. රජයේ නිලධරයන් විශ්‍රාම ගැන්වීම සඳහා ඉල්ලීම් කරන අවස්ථාවන්හිදී මෙම කරුණු පත් කිරීම් බලධරයාගේ අවධානයට යොමු කිරිම දෙපාර්තමේන්තු ප්‍රධානගේ හා/හෝ ආයතන ප්‍රධානගේ වගකීම වන්නේය.

(v) පත් කිරීම් බලධරයා විසින් රජයේ නිලධරයෙකුගේ විශ්‍රාම ගැන්වීම අනුමත කිරීමෙන් අනතුරුව, විනයානුකූලව ක්‍රියාකළ යුතු වන වරදක් නිලධරයා විසින් සිදුකර ඇති විටෙක, එම කරුණු විශ්‍රාම ගැන්වීම බලාත්මක වීමට පෙර පත් කිරීම් බලධරයාගේ අවධානයට යොමු කළ හොත්, එවිට සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තියට යටත් විශ්‍රාම ගැන්වීමක් ලෙසට පරිවර්තනය කිරීමට හා එම

නියෝගයේ පිටපතක් නිලධරයා වෙත ලබා දීමට හෝ ලැබීමට සැලැස්වීමට පත් කිරීම් බලධරයා ක්‍රියා කළ යුතු වන්නේය.

(vi) නිලධරයාට එරෙහිව පවත්නා විනයානුකූල පියවර නොමැති වීම හා විනයානුකූල කටයුතු කිරීමට අදහසක් නොමැති වීම යන කරුණු මත, පත් කිරීම් බලධරයා විසින් රජයේ නිලධරයෙකු සාමාන්‍ය පරිදි විශ්‍රාම ගැන්වීම අනුමත කර ඇති විටෙක, එවැනි විනයානුකූල පියවර නිලධරයාට එරෙහිව ගනිමින් පවතින බව හෝ ගැනීමට අදහස් කර ඇති බව, එම සාමාන්‍ය පරිදි විශ්‍රාම ගැන්වීම අනුමත කළ දිනට පසුව හා විශ්‍රාම ගැන්වීම බලාත්මක වන දිනට පෙරාතුව පත් කිරීම් බලධරයාගේ අවධානයට යොමු කළ හොත් එම සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත් විශ්‍රාම ගැන්වීමකට පරිවර්තනය කිරීමට හා එම නියෝගයේ පිටපතක් නිලධරයා වෙත ලබා දීමට හෝ ලැබීමට සැලැස්වීමට පත් කිරීම් බලධරයා ක්‍රියා කළ යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී.එම්.එල්.සී.සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව